(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 40.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2020 දෙසැම්බර් 05 සෙනසුරාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

60/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ක්‍රිකට් විශ්වවිද්‍යාලයක් ඉදිකිරීමට සැලැස්මක් සකස් කර තිබුණේද;

(ii) ඒ සඳහා මහනුවර ප්‍රදේශයෙන් ඉඩමක් මිලදී ගැනීමට මුදල් වියදම් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා වියදම් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ඉඩම මිලදී ගැනීමේදී විශාල මූල්‍ය වංචාවක් සිදු කර ඇති බව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කර ඇති වාර්තා මගින් පෙන්වා දී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ සම්බන්ධව අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

166/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

422/2020

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ හතරවන අදියරෙහි (කුරුණෑගල - දඹුල්ල) වර්තමාන තත්ත්වය මෙම සභාවට දන්වන්නේද;

(ii) ඉහත ව්‍යාපෘතිය හේතුවෙන් දේපළ අහිමි වන්නන් සඳහා ගෙවනු ලබන වන්දි මුදල පිළිබඳව මේ වනවිට නිශ්චය කර තිබේද;

(iii) එසේ නම්, එය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iv) ඉහත ව්‍යාපෘතිය හේතුවෙන්, විහාර සන්තක දේපළ භුක්ති විඳින්නන්ගේ අහිමිවන දේපළ සඳහා වන්දි ගෙවනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා වන්දි ගෙවීමේදී—

(i) භූමිය සඳහා ගෙවීම් කරන අනුපාතය;

(ii) සංවර්ධන වටිනාකම සඳහා ගෙවීම් කරන ආකාරය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

430/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ වයඹ පළාත තුළ දැදුරු ඔය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා වැය කළ/කරන මුදල කවරේද;

(ii) ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයාගත් ප්‍රභවයන් කවරේද;

(iii) ව්‍යාපෘතිය සඳහා ඉඩම් පරිත්‍යාග කළ පවුල් සංඛ්‍යාව කවරේද;

(iv) එම පවුල් සඳහා ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවීමට කටයුතු කළේද;

(v) එම පවුල් සඳහා වන්දි ගෙවීම වෙනුවෙන් වැයකර තිබෙන මුදල කවරේද;

(vi) මේ වනතෙක් වන්දි ගෙවා නොමැති පවුල් සඳහා වන්දි ගෙවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

491/2020

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආනවිලුන්දාව කුරුළු අභය භූමිය (රම්සා තෙත්බිම) තුළ දැනට අනවසර ඉස්සන් වගාව සිදුවන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ප්‍රදේශය තුළ, ඉස්සන් වගාව සිදු කරන ලද කොටු අත්හැරීම මෙන්ම, ඒවා නැවත ප්‍රතිසංස්කරණය කරමින් භාවිතා කරන බව එතුමා පිළිගන්නේද;

(ii) ඉහත අනවසර ඉස්සන් වගාව නවතා දැමීමට ගනු ලැබූ පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

518/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1973 දී පමණ ආරම්භ කර දැනට වසර තුනකට අධික කාලයක සිට අක්‍රියව පවතින ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලයට යාබදව පිහිටි අයිස් කර්මාන්ත ශාලාව නැවත ප්‍රතිසංස්කරණය කර ක්‍රියාත්මක කළ යුතු බවත්;

(ii) එමගින් ධීවර බෝට්ටු සහ මාළු දැල් උපයෝගී කර ගනිමින් ධීවර කර්මාන්තයේ නිරත වන සහ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයේ නිරත වන දේශීය ධීවරයන්ට සෙත සැලසෙන අතර ඔවුන්ගේ ජීවනෝපායද ඉහළ නැංවීමට අවස්ථාව උදාවන බවත්;

(iii) එහි පවතින ගබඩා පහසුකම් නිසා ශික්ෂණ රෝහලට සහ වෙනත් විවිධ ආයතනවලට අවශ්‍ය මුහුදු ආහාර ගබඩා කර බෙදාහැරීම සිදු කළ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අයිස් කර්මාන්තශාලාව ප්‍රතිසංස්කරණය කර නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

521/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සහකාර පොලිස් අධිකාරී තනතුරේ පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවූයේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සම්මුඛ පරීක්ෂණය සඳහා නිලධාරීන් කැඳවූයේද;

(ii) එම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය කවරේද;

(iii) සම්මුඛ පරීක්ෂණය කැඳවා තිබූ කාලය තුළ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය සංශෝධනය කළේද;

(iv) එසේ ක්‍රමවේදය සංශෝධනය කිරිම යෝග්‍යද;

(v) එම ක්‍රමවේදය සංශෝධනය කිරීම පිළිබඳව අයදුම්කරුවන් දැනුම්වත් කළේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කරන අතරතුර අයදුම් කළ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය පෙරදාතම් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම නිලධාරීන්ගේ නම් කවරේද;

(iii) එසේ පෙරදාතම් කිරීමේ පදනම කවරේද;

(iv) අනතුරුව, කිසිදු දැනුම්දීමකින් හා හේතු දැක්වීමකින් තොරව සම්මුඛ පරීක්ෂණය කල් දැමුවේද;

(v) මේ වනවිට සම්මුඛ පරීක්ෂණයේ තත්ත්වය කවරේද;

(vi) සම්මුඛ පරීක්ෂණය ඉදිරියේදී පවත්වන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) සහකාර පොලිස් අධිකාරී තනතුරේ රාජකාරී ආවරණය කිරීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයේ නිලධාරීන් යෙදවූයේද;

(ii) එසේ නම්, එම රාජකාරී කවරේද?

යන්නත් වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

782/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2011 සිට 2013 දක්වා වූ කාලය තුළ මුසලි ප්‍රදේශයේ පිහිටි කුඩා වැව් ප්‍රතිසංස්කරණය කළ බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම කාලය තුළ ප්‍රතිසංස්කරණය කළ වැව් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වැව්වල නම් කවරේද;

(iv) එම වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආයෝජනය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2014 සිට 2015 දක්වා වූ කාලය තුළ ප්‍රතිසංස්කරණය කළ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආයෝජනය කළ මුළු මුදල කොපමණද;

(iv) ඉහත කාලය තුළ මෙම වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ ආයතනය කවරේද;

(v) එම ආයතනය තෝරා ගනු ලැබූ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන (2021) පනත් කෙටුම්පත — (දහසය වැනි වෙන් කළ දිනය) — කාරක සභාව.

(දෙසැම්බර් 04 දින ප්‍රගතිය)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 112 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2019 අප්‍රේල් 08 දිනැති අංක 2118/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2020.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

* 3.

සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය සහ වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

* 4.

ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

කර්මාන්තශාලා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සාක්ෂි (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ඇප (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන (2021) පනත් කෙටුම්පත නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---